**ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කරන ලද සුනාමියෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශ නැවත ගොඩනැංවීමේ ව්‍යාපෘතියේ - "සී" සංරචකය (මාර්ග පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය) -2010**

1. **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුනු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූල ධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් එම ගණුමට ඌන පූර්ණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තා වල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව

(ඈ) ප්‍රදාන/ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ප්‍රදාන සහ ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වු තොරතරු අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.3,510,011,666 ක් වූ අතර 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.7,816,367,003 ක් විය. ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය සඳහා වියදම සහ 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම් පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම | | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2010 | 2009 | |
| | රු. | රු. | රු. |
| ස්ථාවර වත්කම් | 1,313,809 | 74,202 | 7,931,665 |
| කෙරගෙන යන වැඩ/ නිමවු ව්‍යාපෘති | 3,326,368,842 | 2,436,421,524 | 7,314,087,956 |
| උපදේශක සේවා | 182,329,015 | 205,171,123 | 494,347,382 |
| එකතුව | 3,510,011,666 | 2,641,666,849 | 7,816,367,003 |

### 2.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වු තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | රු. | රු. | එ.ජ. ඩොලර් |
|---|---|---|---|
| 2010 ජනවාරි 01 දිනට ශේෂය | | 403,235,119 | 3,525,263 |
| එකතු කළා:- ප්‍රතිපූර්ණයන් | | 682,737,259 | 5,979,501 |
| | | 1,085,972,378 | 9,504,764 |
| අඩුකළා:- ආපසු ගැනීම් | (1,080,461,581) | | (9,504,764) |
| විදේශ විනිමය පාඩුව | (5,510,797) | (1,085,972,378) | |
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | | නැත | නැත |

## 3. <u>විගණන නිරීක්ෂණ</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 මාර්තු 31 දිනට ව්‍යාපෘතියේ සියළුම කටයුතු අවසන් විය යුතුය යන්න නොසලකා ව්‍යාපෘතිය විසින් 2011 දෙසැම්බර් 31 දින දක්වාම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්යාල ගොඩනැගිල්ලේ කුලිය වශයෙන් රු.418,000 මුදලක් 2010 දෙසැම්බර් මාසයේදී ගෙවා තිබුණි.

(ආ) ගබඩා පරිශ්‍රය සඳහා ගෙවා තිබුණු මූලික ගෙවීම් මුදල, 2010 අප්‍රේල් හා මැයි මාස වල මාසික කුලී මුදලින් අයකර නොගැනීම හේතුවෙන් 2010 දෙසැම්බර් 31 දිනට ගබඩා පරිශ්‍රය සඳහා කුලී මුදල රු.46,644 ක් වැඩියෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණු එකතුව රු.243,375 ක මුද්‍රණ ගාස්තු හා රු.705,315 ක වාහන කුලී ගාස්තු ව්‍යාපෘති කටයුතු වලට සම්බන්ධ වියදම් නොවුණු බව නිරීක්ෂණය විය.

(ඉ) ව්‍යාපෘතියට තාවකාලිකව අනයුක්ත කර සිටි පරිගණක ක්‍රියාකරුවෙකු 2008 ජූලි 21 දින සිට මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යංශයට මාරුකර යවා තිබුණි. කෙසේ වෙතත්, 2010 දෙසැම්බර් 31 වන තෙක් එකතුව රු.874,407 ක් වූ පාරිශ්‍රමිකයක ව්‍යාපෘතිය විසින් මෙම නිලධාරියාට ගෙවා තිබුණි. ඊට අමතරව, ව්‍යාපෘතිය විසින් මෙම කාලය සඳහා වැටුපෙන් 1/3 දීමනාවක්ද වශයෙන් රු.159,285 ක මුදලක් ද මෙම නිලධාරියාට ගෙවා තිබුණි.

## 4. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ මූල්‍යනය, අයවැය ප්‍රතිපාදනය සහ අරමුදල් උපයෝජනය සම්බන්ධයෙන් වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| | ප්‍රදාන/ණය ගිවිසුම්වල ප්‍රතිපාදනය කිරීමට එකඟ වූ මුදල | | 2010 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|
| | එ.ජ. ඩොලර් මිලියන | රු. මිලියන | රු. මිලියන | % |
| ආසියානු සංවර්ධන බැංකු ප්‍රදාන | 55.2 | 5,531.4 | 5,971.2 | 108 |
| ආසියානු සංවර්ධන බැංකු ණය | 4.0 | 400.8 | 325.9 | 81 |
| ශ්‍රී ලංකා රජය | 14.3 | 1,432.9 | 836.4 | 58 |
| | 73.5 | 7,365.1 | 7,133.5* | 96 |

* වැඩ පූර්ව අත්තිකාරම් ඇතුලත් නොවීම හේතුවෙන් මෙම සංඛ්‍යාවන් 4.1 ඡේදයේ දැක්වුණු සංඛ්‍යා වලින් වෙනස් වේ.

### 4.2 භෞතික කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ උපදේශකවරුන් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ වාර්තාව අනුව පාලම් තුනක් ද ඇතුලත්ව දිග කි.මී. 331.4 ක් වූ ජාතික මාර්ග නවයක් සහ දිගින් කි.මී. 38.4 ක් වූ දකුණු පළාතේ පිහිටි පළාත් මාර්ග නවයක් 2010 දෙසැම්බර් 31 දින වන විට ප්‍රමාණවත්ව සම්පූර්ණ කර තිබුණි.

(ආ) නියමිත කාලය තුල වැඩ සම්පූර්ණ කිරීමට කොන්ත්‍රාත්කරු අසමත්වීම හේතුවෙන් කි.මී. 13.95 ක් දිගැති මාතර දිස්ත්‍රික්කයේ පිහිටි පළාත් මාර්ග හතරක පුනරුත්ථාපනය

කිරීමට ප්‍රදානය කළ රු.155,636,432 ක් වටිනා කොන්ත්‍රාත්තු පසුකාලීනව අවලංගු කර තිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම කොන්ත්‍රාත්තු සඳහා කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවනු ලැබූ රු.8,932,606 ක වැඩපූර්ව අත්තිකාරම් ශේෂයක, 2010 දෙසැම්බර් 31 දින වන විටත් අය නොකර පැවතුණි. මේ සම්බන්ධයෙන් වූ කාර්ය සාධන බැඳුම්කරයේ වලංගු කාලය 2009 ඔක්තෝබර් 29 දින කල් ඉකුත් වී තිබුණි. කෙසේ වෙතත් 2011 අගෝස්තු 31 දින වන විටත් කාර්ය සාධන බැඳුම්කර නැවත වලංගු කර ගැනීමට හෝ රු.10,348,007 ක් වූ රඳවා ගත් මුදල් වලින් අයවිය යුතු මුදල අයකර ගැනීමට හෝ පියවර ගෙන නොතිබුණි.

(ii) ඉතිරි වැඩ කොටස සම්පූර්ණ කිරීම සඳහා අදාල පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව 2010 මැයි 24 දින රු.176,591,122 ක ඇස්තමේන්තුගත පිරිවැයකට වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කර තිබුණි. ඉතිරි වැඩ කොටස ඉටුකිරීම සඳහා රු.85,770,162 ක් වටිනා විචලතා නියෝගයක් අනුමත කර තිබුණු අතර ඉන් පෙනීයන්නේ පළමු කොන්ත්‍රාත්කරුගේ අසාර්ථකත්වය හේතුවෙන් මුල් ඇස්තමේන්තුව ඉක්මවා 66% කින් මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඉහළ ගොස් තිබුණු බවය.

(ඇ) කළුතර දිස්ත්‍රික්කයේ කිලෝමීටර් 5.04 දිගැති පයාගල - දොඩන්ගොඩ මාර්ගය හා මොල්ලිගොඩ - කොරස්දූව මාර්ගය, ගාල්ල දිස්ත්‍රික්කයේ කිලෝමීටර් 11.75 ක් දිගැති වලාන - හබරාදූව මාර්ගය හා හියාරේ - කඳුරුගස්හේන මාර්ගය සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිලෝමීටර් 7.65 ක් දිගැති පල්ලේමල්ල - බඳගිරිය මාර්ගය යන අනෙකුත් පළාත් මාර්ග වල පුනරුත්ථාපන කටයුතු වල ප්‍රගතිය, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය තුළ ලිඛිත සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.